# පටුන


| පටුන | පිටුඅංක |
|---|---|
| හැඳින්වීම | 01 |
| දැක්ම | 02 |
| මෙහෙවර | 02 |
| කාර්යයන් | 03 |
| නිමැවුම | 03 |
| කාර්යමණ්ඩලය | 04 |
| තොරතුරුතාක්ෂණය හා කළමනාකරණය | 04 |
| පුහුණු කිරීම් හා හැකියා වර්ධන | 08 |
| සේවාවැඩිදියුණුකිරීම | 09 |
| 2015 වර්ෂය තුළ ප්‍රකාශයට පත් කල රෙගුලාසි | 10 |
| 2015 වර්ෂය තුළ නිකුත් කල බලපත්‍ර සංඛ්‍යාව සහ අය කල බලපත්‍ර ගාස්තු | 10 |
| ආදායම් විශ්ලේෂණය - 2015 | 13 |
| ආදායම - 2015 | 13 |
| ආදායමෙන් ආපසු ගෙවීම් - 2015 | 13 |
| වියදම්විශ්ලේෂණය - 2015 | 14 |
| පුනරාවර්ථන වියදම හා මූලධන වියදම | 14 |
| මූල්‍ය ප්‍රභවයන් | 15 |
| ආදායම් හා වියදම් විශ්ලේෂණය | 15 |
| පසුගියවසර 5කදත්ත විශ්ලේෂණය | 17 |
| පසුගියවසර 5 තුළ බලපත්‍ර සංඛ්‍යාව සහ ඉපැයූ ආදායම | 17 |
| පසුගියවසර 5 තුළ ආදායම සහ බලපත්‍ර පිළිබඳ දත්ත සමාලෝචනය | 18 |
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම - 29601 | 19 |
| ඇමුණුම 01 - සංවිධාන සටහන | 20 |

# ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

## හැඳින්වීම

1969 අංක 1 දරන පනතින් පිහිට වූ ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව මේ වර්ෂය වන විට පුරා වසර 47 ක් තම මෙහෙවර ජාතිය වෙනුවෙන් ඉටු කර ඇත. ආනයන හා අපනයන පාලනය කිරීමේ අරමුණ පෙරදැරිව මෙම දෙපාර්තමේන්තුව ආරම්භ කලද වර්තමානය වන විට ඊට අදාල ප්‍රතිපත්ති සම්පාදකයෙකුගේ කාර්යයද ඉටු කරනු ලබයි.

වර්තමානය වන විට දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ආනයන හා අපනයන පාලන යාන්ත්‍රනය ක්‍රියාත්මක කිරීම ඉක්මවා ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳව ප්‍රතිපත්තිමය තීරකයා ලෙසද ආනයන හා අපනයන සඳහා පහසුකම් හා ප්‍රවර්ධනය කිරීම දක්වා ද පුලුල් වී මෙම කාර්යභාරය ජාතික ආරක්ෂාව, මහජන සුභසිද්ධිය, පරිසරය හා මහජන සෞඛ්‍ය සුරක්ෂිතතාව ආරක්ෂා කිරීම යන මුලික අභිමතාර්ථ ඇතිව සිදුකරනු ලබයි .

තවද, ජාත්‍යන්තර වෙළඳාම තුල ශ්‍රී ලාංකීය අනන්‍යතාවය සුරක්ෂිත වන පරිදි අපනයන භාණ්ඩ සඳහා ප්‍රමිතිකරණයක් හඳුන්වා දීම ද මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය අතර ට වැටේ. ඊට අමතරව විනිමය පාලන දෙපාර්තමේන්තුව සමග එක් වී විනිමය පාලන රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රායෝගික පියවර ගැනීම ද නව ප්‍රවනතාවයකි.

ශ්‍රී ලංකාව විසින් අපරානුමත කරන ලද බාසල්, ස්ටොක්හෝම් සහ රොටර්ඩෑම් වැනි ජාත්‍යන්තර සම්මුතීන්ට අනුගතව ආනයන හා අපනයන නියාමනය සඳහා පියවර ගෙන ඇත. එසේම පරිසරයට හා මහජන සෞඛ්‍යට අහිතකර වන්නා වූ ග්ලයිපොසේට් වැනි රසායනික ද්‍රව්‍ය ආනයනය පාලනය හෝ තහනම් කිරීම සඳහා පියවර ගෙන ඇත.

ආනයනය කරනු ලබන ඖෂධ සඳහා 2/3ක ජීව කාලය අනිවාර්‍යය කිරීම, කල්ඉකුත් වූ ඖෂධ ආනයනය වැලැක්වීමට ගත් වැදගත් පියවරකි.

# දැක්ම

යහපත් අනාගතයක් උදෙසා පරිසරය හා මහජනතාව සුරක්ෂිත කිරීම

# මෙහෙවර

රටේ ආරක්ෂාව,ආර්ථිකය,මහජන සෞඛ්‍යය,පරිසර සංරක්ෂණය ආදිය සැලකිල්ලට ගෙන භාණ්ඩ ආනයන හා අපනයන පාලනය සම්බන්ධයෙන් රජය විසින් වරින් වර ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ 1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනත අනුව ක්‍රියාත්මක කිරීම.

## කාර්යයන්

- ආනයන හා අපනයන පාලනය සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය රෙගුලාසි ප්‍රසිද්ධ කිරීම.
- ආනයන හා අපනයන බලපත්‍ර නිකුත් කිරීමටයටත්ව ආනයනයන් හා අපනයනයන් පාලනය කිරීම.
- ආනයන හා අපනයන පාලන රෙගුලාසි සම්බන්ධ කරුණුවලදී රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහ විනිමය පාලකවරයාට සහාය වීම.
- වාණිජ බැංකුවලට ආනයන පාලන රෙගුලාසි සම්බන්ධයෙන් මෙහෙයුම් උපදෙස් නිකුත් කිරීම.

## නිමැවුම

- 2015 වර්ෂය තුළදී ආනයන හා අපනයන බලපත්‍ර 14916 ක ප්‍රමාණයක් පමණක් නිකුත් කිරීම තුළින් දෙපාර්තමේන්තුවේ මෙහෙවර ඉටු කිරීම සඳහා වූ ආනයනයන් හා අපනයනයන් පාලනය කිරීම.
- ආනයන බලපත්‍රයට අනුකූලව භාණ්ඩ ආනයනය කලේද යන්න තහවුරු කිරීම් ලබා ගැනීමෙන් පසු හර කිරීම් 22,724 මගින් ආනයන පාලනය විධිමත් කිරීම.
- ආනයන හා අපනයන පාලන ප්‍රතිපත්ති මත විදේශ විනිමය වැය නොවන පදනම මත සිදු කරන ආනයනයන් සඳහා අවසර ලබා දීම.
- ආනයන හා අපනයන පාලන රෙගුලාසිවලට අනුකූල නොවන අවස්ථා සම්බන්ධයෙන් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහ විනිමය පාලක වෙත අවශ්‍ය සහායන් ලබා දීම.
- ආනයන හා අපනයන පාලනය සම්බන්ධයෙන් වාණිජ බැංකුවලට මෙහෙයුම් උපදේශන නිකුත් කිරීම.
- බලපත්‍ර නිකුත් කිරීමෙන් ලද ගාස්තු වශයෙන් රුපියල් මිලියන 1089 ක ආදායමක් එක්රැස් කර රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කරන ලදී.
- නව පරිගණක වැඩසටහනක් හඳුන්වා දී පරිගණක පද්ධති නවීකරණය කිරීම. නව පරිගණක හා උපාංග ස්ථාපිත කිරීම මගින් නව තොරතුරු ගබඩා පද්ධතියක් හා ආනයන හා අපනයන බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවත් පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීම.

## කාර්ය මණ්ඩලය

ආනයන හා අපනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම, හර කිරීම හා ආදායම් එක්රැස් කිරීමේ කාර්යයන් මෙන්ම සාමාන්‍ය කාර්යාල පරිපාලන කටයුතු මෙන්ම ප්‍රතිපත්ති හා සැලසුම් කාර්යයන් පහත කාර්ය මණ්ඩලය මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ යොදවන ලදී. (වගුවඅංක 01)

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ සේවාවන් ඉහළම කාර්යක්ෂමතාවයෙන් පවත්වාගෙන යාමටත්, සේවාදායකයින්ට ඵලදායී කාර්යක්ෂම හා මිත්‍රශීලී සේවාවක් සැපයීමටත් මෙම කාර්ය මණ්ඩලය වර්ෂය මුළුල්ලේම වගකීමෙන් යුතුව සාමූහිකව ක්‍රියාකරන ලදී.

2015.12.31 දිනට කාර්ය මණ්ඩලය — වගුව අංක 01


| අනු අංකය | තනතුරු නාමය, සේවය හා පන්තිය | අනුමත කාර්ය මණ්ඩලය | සත්‍ය සේවක සංඛ්‍යාව | වෙනස/අතිරික්තය /පුරප්පාඩු |
|---|---|---|---|---|
| 01 | මාණ්ඩලික සේවය | 10 | 07 | 02 |
| 02 | මාණ්ඩලික නොවන | 58 | 53 | 05 |
| 03 | කණිෂ්ඨ ශ්‍රේණිය | 19 | 17 | 02 |
| | | | | |
| | එකතුව | 87 | 77 | 10 |

## තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය

2014 වර්ෂයට පෙර කාලය සැලකූවිට ඉල්ලුම්කරුවකුට බලපත්‍රයක් ලබා ගැනීම සඳහා දින දෙකක කාලයක් ගත විය. එහෙත් 2014 වර්ෂයේ මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කළ අතර දෙපාර්තමේන්තුවේ කාර්යයන් එමගින් නව මාවතකට යොමු කරන ලදි. අදාළ ලියකියවිලි නිවැරදිව සපයන ඉල්ලුම්කරුවකු සඳහා ආනයන හා අපනයන පාලන බලපත්‍රයක් පැය දෙකකටත් අඩු කාලයකින් ලබාදීමට කටයුතු කර ඇත.

නව මෘදුකාංග පද්ධතිය ප්‍රධාන වශයෙන්ම අදියර තුනකින් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.

පළමු වන පියවර ලෙස මෙම පරිගණක පද්ධතිය ස්ථාපිත කර කාර්යක්ෂම සේවාවාක් සැපයීමට බලාපොරොත්තු වේ. දැනට එම කාර්ය නිමකර පැයකින් බලපත්‍ර ලබා ගැනීමට හැකියාව ඇති අතර හර කිරීම් ක්‍රියාවලිය සඳහා ගත වන්නේ පැය ½ක තරම් අඩු කාලයක්ය.





දෙවන පියවර ලෙස මෘදුකාංග පද්ධතිය බාහිර ආයතනයන් හා සම්බන්ධ කිරීමට බලාපොරොත්තු වේ. විශේෂයෙන් බලපත්‍ර පාලනය හා නිකුත් කිරීම සම්බන්ධ ක්‍රියාවලිය තුළ ඊට බැඳී ඇති බාහිර ආයතන විශාල සංඛ්‍යාවක් පවතින බව හඳුනාගෙන ඇති බැවින් එම ආයතන හා සෘජු සම්බන්ධතාවයක් පවත්වා ගැනීම තුළින් ඉතා පුළුල් නිවැරදි කාර්යක්ෂම සේවාවක් සැපයීමට බලාපොරොත්තු වේ.

උදාහරණ වශයෙන්:


1. ශ්‍රී ලංකා රේගුව
2. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
3. පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය
4. ජාතික ඖෂධ පාලන ඒකකය
5. ජාතික ඖෂධ නියාමන අධිකාරිය
6. ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

ආදී බාහිර ආයතන විශාල සංඛ්‍යාවක් ආනයන හා අපනයන පාලන බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය හා සම්බන්ධ වේ. දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය මෙම ආයතන හා සෘජුව සම්බන්ධ කිරීම තුළින් කාර්යක්ෂම සේවාවක් මෙන්ම අක්‍රමිකතාවලින් තොර පරිසරයක් නිර්මාණය කිරීමට අවකාශ ලැබෙන බව හඳුනාගෙන ඇත.




දෙවන අදියර ලෙස ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන මෙම වැඩපිළිවෙල තුළ දැනටමත් ශ්‍රී ලංකා රේගුව සමඟ දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය සම්බන්ධ කර ඇති අතර එමගින් මෙම දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ඕනෑම බලපත්‍රයක නිරවද්‍යතාවය රේගු දෙපාර්තමේන්තුවේ ඕනෑම නිශ්කාෂණ එක් පරිශ්‍රයක සිට තහවුරු කරගත හැකිය.

ඒ අනුව, ආනයන හා අපනයන පාලන බලපත්‍රයක් මත ආනයන හා අපනයන භාණ්ඩවල නිරවද්‍යතාවය 100%කින් යුතුව භාණ්ඩ නිශ්කාෂණය කිරීම ශ්‍රී ලංකා රේගුවට අවකාශ ලැබී ඇත.




2016 වර්ෂය අවසන්වීමට ප්‍රථම බලපත්‍ර පාලන ක්‍රියාවලිය හා බැඳී ඇති අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ පරිගණක පද්ධතිය සම්බන්ධ කිරීමට බලාපොරොත්තු වේ. තෙවන අදියර ලෙස ඕනෑම අයදුම්කරුවකු හට ආනයන හෝ අපනයන අයදුම්පත අන්තර්ජාලය තුළින් ඉදිරිපත් කිරීමේ හැකියාව ලබාදීමට කටයුතු කරනු ඇත. තවද, අදාළ බලපත්‍ර ගාස්තුද අන්තර් ජාලය තුළින්ම ප්‍රේෂණය කිරීමේ හැකියාව ලබාදීමට ද මෙමගින් අවකාශය ලබාදීමට බලාපොරොත්තු වේ.

## පුහුණු කිරීම් හා හැකියා වර්ධනය

දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ දැනුම වර්ධනය කර සේවාවන් ඉහළ කාර්යක්ෂමතාවයෙන් හා ඵලදායකත්වයෙන් යුතුව පවත්වාගෙන යාම සඳහා 2015 වර්ෂය තුළදී පහත පරිදි දේශීය සහ විදේශීය පුහුණු සඳහා නිලධාරින් යොමු කර ඇත.

**<u>දේශීය පුහුණු</u>**

**I.** මාණ්ඩලිකනිලධාරින්

- Training Program on regulatory frame work applicable to Imports & Exports -01
- Certificate in English for Professionals –Level 1 -01
- Workshop on HR Strategy to buildup managerial skills in the public sector -01

**II.** කළමනාකරණ සහකාර සේවයේ නිලධාරින්

- National IT Conference 2015 -01

**<u>විදේශීය පුහුණු</u>**

| නිලධාරියාගේනම | පුහුණුපාඨමාලාව |
|---|---|
| අයි.එන්. වීරසේකර මෙනවිය- සහකාර පාලක | 1. Pre-shipment and cracking down on fake and counterfeit product for developing countries – China<br>2. International programme on Advanced Management – AIT Bangkok – Thailand |
| එච්.එම්.පී.සී. කුමාරිහාමි මිය - සහකාර පාලක | 1. Investment & Trade Facilitation – Singapore |
| පී.එල්.ජී. ගුණරත්න මිය - සහකාර පාලක | 1. Seminar on quality and safety management of agricultural exports for developing countries – Mongolia<br>2. International programme on Advance Management – AIT Bangkok –Thailand |
| කේ.එන්.කේ. විද්‍යාලංකාර මෙනවිය-සහකාර පාලක | 1. Training programme on Quality infrastructure |

| | |
|---|---|
| | development in support of world trade – Sweden<br>2. Seminar on Import and Export food inspection officials for developing countries – China |
| ඩී.සී. ජයමාලි ජයතුංග මෙනවිය - ප්‍රතිපත්ති හාසැලසුම් සම්පාදක සහකාර | 1. Association of Export and Import Enterprises for developing countries - China |

## සේවා වැඩි දියුණු කිරීම

දෙපාර්තමේන්තුවේ සේවාවන් උසස් තලයකට නැංවීම සඳහා දෙපාර්තමේන්තු ව්‍යුහයේ වෙනස්කම් සිදුකිරීම, ඉතා කාර්යක්ෂම පරිගණක පද්ධතියක් හඳුන්වා දීම, කාර්යමණ්ඩලයේ හැකියාවන් සහ කුසලතාවයන් ඔප් නැංවීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම ආදිය සිදුකර ඇත.

අයදුම්පත් නිකුත් කිරීමේ සිට බලපත්‍රයක් නිකුත්කිරීම දක්වා සහ බලපත්‍ර හර කිරීම් නියාමනය කිරීමට හැකි ස්වයංක්‍රීය පරිසනකගත වැඩපිළිවෙලක් වෙත දෙපාර්තමේන්තුව යොමුවී ඇත. මෙයට අයපත් නිකුත් කිරීම ද ඇතුලත්වේ.

බලපත්‍ර නිකුත් කිරීමේ හා හර කිරීමේ තොරතුරු එසැනින් විද්‍යුත් මාර්ගයෙන් ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙත සම්ප්‍රේෂණය කිරීමටත්, හර කිරීම් පිළිබඳ හර තොරතුරු රේගු දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හර කිරීම් ක්‍රියාවලය පහසු කිරීමටත් මෙම පරිසනක පද්ධතිය ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව හා සම්බන්ධකර ඇත.

පරිසනක පද්ධතිය බලපත්‍ර නිකුත් කිරීම සඳහා අනුමැතිය සහ නිර්දේශ ලබාදෙන ආයතන හා ඍජුව සම්බන්ධ කෙරෙනු ලබන අතර, මෙම බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය හා සම්බන්ධ වීමෙන් පාරිභෝගිකයන්ට පහසු හා වේගවත් සේවාවක් ලබාදීමට හැකිවනු ඇත.

එමෙන්ම සේවාවන් ඉහල නැංවීමට ගනු ලබන ඍජු හා වක්‍ර ක්‍රියාමාර්ග තුළින් ව්‍යාපාරික ප්‍රජාවට මෙන්ම පොදු මහ ජනතාවට සමාන හා අපක්ෂපාතී සේවාවන් සැලසීමට හැකි බව දෘශ්‍යමාන වන අතර, මේ වන විට දෙපාර්තමේන්තුවට ද එසේ නිවැරදි, කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සැලසීමට හැකි වීඇත.

## 2015 වර්ෂයතුළ දී ප්‍රකාශයට පත් කළ නව රෙගුලාසි

ආනයනයන් හා අපනයනයන් පිළිබඳ රජයේ ප්‍රතිපත්ති ක්‍රියාවට නංවමින් නව රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීමට පහත සඳහන් අතිවිශේෂ ගැසට් නිවේදනයන් ප්‍රකාශයට පත් කර ක්‍රියාත්මක කරන ලදී.

වගුව අංක 02

| අතිවිශේෂ ගැසට් පත්‍රය නිකුත් කළ දිනය | අතිවිශේෂ ගැසට් පත්‍ර අංකය | අන්තර්ගතය |
|---|---|---|
| 29.01.2015 | 1899/34 | සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ පවතින මෝටර් රථවල විස්තරය සංශෝධනයට ලක් කිරීම. |
| 26.02.2015 | 1903/41 | මෝටර් රථ සම්බන්ධයෙන් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සංශෝධනයට ලක් කිරීම. |
| 30.04.2015 | 1912/31 | පුවක් ආනයන හා අපනයන පාලන බලපත්‍ර පාලනයට යටත් කිරීම |
| 03.06.2015 | 1917/24 | ආනයන හා අපනයන බලපත්‍රගාස්තු හා අතිරේක ගාස්තු සංශෝධනය |
| 11.06.2015 | 1918/22 | ග්ලයිෆොසේට් ආනයනය තහනම් කිරීම |
| 18.06.2015 | 1919/45 | පුවක් සඳහා ආනයන හා අපනයන බලපත්‍ර ගාස්තු සංශෝධනය |

## 2015 වර්ෂයේ නිකුත්කල බලපත්‍ර සංඛ්‍යාවන් සහ අයකල බලපත්‍ර ගාස්තු

වගුව අංක 03

| අංක | විස්තරය | සංකේත අංකය | බලපත්‍ර සංඛ්‍යාව | බලපත්‍ර ගාස්තුව |
|---|---|---|---|---|
| **ඒකක 01 - ඖෂධ** | | | | |
| 1 | බටහිර ඖෂධ | 400 | 1928 | 78,318,085.47 |
| 2 | පශු | 410 | 415 | 4,556,846.01 |
| 3 | ආයුර්වේද | 420 | 203 | 670,363.57 |
| 4 | හෝමියෝපති | 430 | 08 | 11,113.04 |
| 5 | ශල්‍ය උපාංග | 450 | 178 | 2,438,451.21 |
| උප එකතුව | | | **2732** | **85,994,859.30** |
| **ඒකක 02 -වාහන** | | | | |

| | | | | |
|---|---|---|---|---|
| 6 | විදේශ විනිමය ඉපයීම මත | 100 | 08 | 410,494.50 |
| 7 | විදේශ රැකියා නියුක්තිකයින්ගේ ත්‍යාග | 110 | - | - |
| 8 | විදේශකයින් විසින් ආනයනය කරන වාහන | 120 | 01 | 4,381.30 |
| 9 | තානාපති කාර්යාල | 130 | 01 | 1,441.90 |
| 10 | ආබාධිත පුද්ගලයින් සඳහා ත්‍යාග | 140 | 02 | 84,143.55 |
| 11 | සමාජ සේවා සංවිධාන ත්‍යාග | 150 | 11 | 439,282.50 |
| 12 | නේවාසික විදේශකයින් | 160 | 02 | 92,110.04 |
| 13 | පූජනීය ස්ථාන සඳහා වාහන ආනයනය | 170 | 01 | 166,500.00 |
| 14 | විශේෂ කාර්යය යන්ත්‍ර | 180 | 32 | 25,638,884.48 |
| 15 | මෝටර් ට්‍රේලර් (පාවිච්චි කළ) | 185 | 01 | 249,750.00 |
| 16 | අපනයන ප්‍රවර්ධනය සඳහා තාවකාලික ආනයනය | 190 | 01 | 33,300.00 |
| 17 | අවමංගල රථ | 200 | 07 | 360,750.00 |
| 18 | ගුවන්යානා / හෙලිකොප්ටර් සඳහා අමතරකොටස් | 210 | 71 | 235,252.03 |
| 19 | එන්ජින් | 220 | 01 | 1,120.00 |
| 20 | කැබින් | 230 | 36 | 127,681,606.95 |
| 21 | බොඩිෂෙල් | 235 | 18 | 560,074.93 |
| 22 | පාවිච්චි කළ මෝටර් බයිසිකල් | 240 | 20 | 312,576.73 |
| 23 | විවිධ | 250 | 145 | 20,181,640.57 |
| 24 | තානාපති සේවයේ නිලධාරින් ආනයනය කරන වාහන | 260 | 17 | 129,295.81 |
| 25 | බර වාහන | 270 | 123 | 37,942,954.39 |
| 26 | බර වාහන (LC Permit) | 275 | 04 | 34,410.00 |
| 27 | වාහන අමතර කොටස් | 280 | 28 | 349,545.38 |
| 28 | ටයර් | 285 | 11 | 63,623.21 |
| 29 | වැසි | 290 | 27 | 7,721,227.12 |
| 30 | සීට් | 320 | 171 | 13,036,746.24 |
| 31 | පරීක්ෂා කිරීම් වලදී වන කොන්දේසි වලට එකඟනොවීම | 321 | - | - |
| | | | | |
| **උප එකතුව** | | | **739** | **235,731,111.63** |

| අංක | විස්තරය | සංකේත අංකය | බලපත්‍ර සංඛ්‍යාව | බලපත්‍ර ගාස්තුව |
|---|---|---|---|---|
| **ඒකක 03 - රසායන ද්‍රව්‍ය** | | | | |
| 32 | රසායනික ද්‍රව්‍ය | 500 | 1074 | 9,224,237.59 |
| 33 | ඛනිජ තෙල් නිෂ්පාදන | 510 | 920 | 157,778,397.15 |
| 34 | පළිබෝධ නාශක | 520 | 1373 | 45,388,499.92 |
| 35 | විකිරණ ද්‍රව්‍ය | 530 | 76 | 405,062.56 |
| 36 | මධ්‍යසාර | 540 | 285 | 21,571,304.61 |

| | | | | |
|---|---|---|---|---|
| 37 | සත්ත්ව නිෂ්පාදන | 550 | - | - |
| 38 | ධාන්‍ය | 570 | 116 | 12,871,996.28 |
| **උප එකතුව** | | | **3844** | **247,239,498.11** |
| **ඒකක 04 - විදුලි සංදේශ උපකරණ හා වෙනත්** | | | | |
| 39 | සිගරට් කොළ | 670 | 61 | 473,314.58 |
| 40 | පරිගණක | 625 | 189 | 25,344,814.90 |
| 41 | ශීතකාරක ගෑස් වර්ග | 640 | 30 | 123,918.29 |
| 42 | මුද්‍රණ යන්ත්‍ර හා ඡායා පිටපත් යන්ත්‍ර | 690 | 157 | 1,141,959.90 |
| 43 | දුරස්ථ පාලක සෙල්ලම් බඩු | 660 | 124 | 199,668.91 |
| 44 | සන්නිවේදන උපකරණ හා ජංගම දුරකථන | 620 | 2068 | 34,998,764.81 |
| 45 | වායුසමීකරණ යන්ත්‍ර,පාවිච්චි කරන ලද ශීතකරණ හා අධි ශීතකරණ | 630 | 53 | 260,261.96 |
| 46 | පාවිච්චි කරන ලද රෙදි සෝදන යන්ත්‍ර | 635 | 28 | 1,210,049.22 |
| 47 | කාලගුණ බැලුන් | 695 | 03 | 12,873.08 |
| 48 | වායුසමීකරණ (නවීන) | 645 | 39 | 724,138.31 |
| 49 | ජංගම දුරකථන (පාවිච්චි කරන ලද /නවීන) | 615 | 1586 | 160,082,866.49 |
| **උප එකතුව** | | | **4338** | **250,572,630.55** |
| **ඒකක 05 -විවිධ ආනයන හා අපනයන** | | | | |
| 50 | ගුවන්යානා අමතර කොටස් | 210 | 11 | 365,330.26 |
| 51 | ඇල්කොහොල් | 540 | 49 | 1,822,025.39 |
| 52 | සත්ව හා සත්ව නිෂ්පාදන | 550 | 1567 | 27,412,143.63 |
| 53 | තේ | 570 | 187 | 1,689,243.44 |
| 54 | රසායනික ද්‍රව්‍ය හා වල්නාශක | 500 | 32 | 135,443.46 |
| 55 | රසායනික ද්‍රව්‍ය, කෘෂිකාර්මික රසායන වල්නාශක | 520 | 54 | 261,052.32 |
| 56 | කාසි | 610 | 02 | 2,208,792.99 |
| 57 | පුපුරණ ද්‍රව්‍ය හා ගිනි අවි | 600 | 169 | 1,339,622.99 |
| 58 | ලෝහ කැබලි,සුන්බුන් හා වෙනත් | 715 | 18 | 715,575.86 |
| 59 | අබිලි ලෝහ සුන්බුන් | 710 | 209 | 6,684,145.43 |
| 60 | විවිධ | 250 | - | - |
| 61 | ඛණිජ තෙල්, ඛනිජතෙල් නිෂ්පාදන | 510 | 25 | 80,329.12 |
| 62 | දැව තෙල් | 700 | 418 | 3,682,705.23 |
| 63 | පාවිච්චි කළ ඇඳුම් | 720 | 65 | 141,728.53 |
| 64 | ක්‍රීඩා භාණ්ඩ | 650 | 08 | 38,392.65 |
| 65 | විදුලි සංදේශ උපකරණ හා ජංගම දුරකථන | 620 | 177 | 31,285,540.37 |
| 66 | ඉරන ලද දැව කොටස් | 602 | 10 | 14,430.04 |
| 67 | පාවිච්චි කරන ලද ගෘහ භාණ්ඩ | 680 | 88 | 3,365,854.40 |
| 68 | ඉවත ලන සිලින්ඩර් | 640 | - | - |
| 69 | ප්ලාස්ටික් කෑම භාජන | 730 | - | - |
| 70 | විකිරණශීලි ද්‍රව්‍ය | 530 | - | - |
| 71 | තේ | 580 | 204 | 9,323,760.79 |
| 72 | අපනයන | 605 | 01 | 5,549.99 |
| 73 | ඉරූ දැව | 440 | 01 | 2,220.00 |

| | | | | |
|---|---|---|---|---|
| 74 | කාබනික පොහොර | 735 | 09 | 322,411.01 |
| උප එකතුව | | | **3274** | **90,896,297.90** |
| මුළු එකතුව | | | **14,927** | **910,434,397.49** |

## ආදායම් විශ්ලේෂණය - 2015

දෙපාර්තමේන්තුව 2015 වර්ෂය තුළදී රුපියල් මිලියන 1089ක ආදායමක් උපයා ගැනීමට සමත් විය. 2014 වර්ෂය හා සැසඳීමේදී ආදායම 68.9% කින් වැඩි වී ඇත. එය පහත පරිදි වර්ගීකරණය කර ඇත.

බලපත්‍ර ආදායම -රු1,089,153,993.23

මෙම **බලපත්‍ර** ආදායම තුළ අතිරේක ගාස්තු සහ සංශෝධන ගාස්තු ද ඇතුලත් වේ.

### I. ආදායම - 2015

ආදායම පිළිබඳ විස්තර වගුව අංක 03 මගින් ඉදිරිපත් කර ඇත.

වගුව අංක 04

| විස්තරය | 2014 සත්‍ය ආදායම රු. | 2015 අනුමත ඇස්තමේන්තුව රු. | 2015 ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව රු. | 2015සත්‍ය ආදායම රු. |
|---|---|---|---|---|
| ආනයන හා අපනයන බලපත්‍ර ගාස්තු | 751,552,566,05 5 | 800,000,000 | 900,000,000 | 1,089,153,993 |

### II. ආදායමෙන් ආපසු ගෙවීම - 2015

වගුව අංක 05

| විස්තරය | මුදල රු. |
|---|---|
| ආපසු ගෙවීම - ආනයන හා අපනයන බලපත්‍ර ගාස්තු | 38,115.41 |

# වියදම් විශ්ලේෂණය - 2015

## I. පුනරාවර්තන වියදම් සහ මූලධන වියදම

2014 වර්ෂය සඳහා රුපියල් මිලියන 54.83ක් පුනරාවර්තන හා මූල ධන වියදම් සඳහා ප්‍රතිපාදනය කර ඇත.වියදම රුපියල් මිලියන 54.40 ක් දරා ඇත.එය මුළු ප්‍රතිපාදනයෙන් 99.22% ක් වේ. විස්තර අංක 6 වගුව යටතේ දක්වා ඇත.

ශීර්ෂ අංකය : 296

අමාත්‍යාංශය : ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

වැඩසටහන් අංකය : 01

ව්‍යාපෘතිය : 01

| විස්තරය | 2014 සත්‍ය වියදම රුපියල් | 2015 අනුමත ඇස්තමේන්තුව රුපියල් | 2015 සංශෝධිත ඇස්තමේන්තුව රු. | 2015 සත්‍ය වියදම රු. | ප්‍රතිපාදන උපයෝජනය % |
|---|---|---|---|---|---|
| පුනරාවර්තන | | | | | |
| පෞද්ගලික පඩි | 31,537,653 | 31,400,000 | 40,980,000 | 39,284,605 | 96% |
| වෙනත් පුනරාවර්තන | 14,446,621 | 16,720,000 | 17,319,260 | 15,106,544 | 87% |
| පුනරාවර්තන වියදම් එකතුව | 45,984,274 | 48,120,000 | 58,299,260 | 54,391,149 | 93% |
| මූලධන | | | | | |
| 2001 - ගොඩනැගිලි ඉදිකිරීම් | - | - | - | - | - |
| 2003 - වාහන | 181,948 | 300,000 | 300,000 | 16,216 | 5% |
| 2102 - ලී බඩු හා කාර්යාල | 7,561,692 | 4,000,000 | 4,000,000 | 2,331,252 | 58% |

| | | | | | |
|---|---|---|---|---|---|
| උපකරණ | | | | | |
| 2401 - පුහුණු කිරීම් හා හැකියා වර්ධනය | 679,000 | 600,000 | 600,000 | 308,000 | 51% |
| මූලධන වියදම් එකතුව | 8,422,640 | 4,900,000 | 4,900,000 | 2,655,468 | 54% |
| මුළු එකතුව | 54,406,914 | 53,020,000 | 63,199,260 | 54,046,616 | 90% |

## II. මූලාා ප්‍රභවයන්

ඒකාබද්ධ අරමුදල මගින් දේශීය අරමුදල් යටතේ වෙන් කර දුන් මුදල් වියදම් කිරීමේදී කාර්යක්ෂමව හා ඵලදායීව වියදම් කිරීමට පියවර ගෙන ඇත.(වගුව අංක 07)

| විස්තරය | 2014 සතා වියදම රු. | 2015 අනුමත ඇස්තමේන්තුව රු. | 2015 සංශෝධිත ඇස්තමේන්තුව රු. | 2015 සතා වියදම රු. |
|---|---|---|---|---|
| ඒකාබද්ධ අරමුදල 11 - දේශීය අරමුදල් | 54,406,915.14 | 53,020,000.00 | 63,199,260.00 | 57,046,616.00 |
| මුළු වියදම | 54,406,915.14 | 53,020,000.00 | 63,199,260.00 | 57,046,616.00 |


## ආදායම් සහ වියදම් විශ්ලේෂණය - 2015

දෙපාර්තමේන්තුව විසින් රුපියල් මිලියන 57ක් වියදම් කර රුපියල්මිලියන 1089ක ආදායමක් උපයා ඇත. එය වගුවකින් දක්වා ඇත.(වගුව අංක 08

වගුව අංක 08

| මාසය | ආදායම (රු.) | වියදම(රු.) |
|---|---|---|
| ජනවාරි | 56,200,504.48 | 4,369,748.35 |
| පෙබරවාරි | 29,962,826.15 | 3,727,664.79 |
| මාර්තු | 47,995,720.32 | 5,063,375.45 |
| අප්‍රේල් | 42,454,665.37 | 4,524,313.40 |
| මැයි | 115,400,884.27 | 4,483,331.13 |
| ජූනි | 80,370,640.05 | 5,367,216.80 |
| ජූලි | 121,621,329.95 | 5,208,137.12 |
| අගෝස්තු | 113,372,259.51 | 4,743,589.80 |
| සැප්තැම්බර් | 120,801,333.66 | 4,718,719.75 |
| ඔක්තෝබර් | 118,615,894.50 | 4,622,575.59 |
| නොවැම්බර් | 100,571,005.67 | 4,538,154.44 |
| දෙසැම්බර් | 141,786,929.30 | 5,679,789.77 |
| **එකතුව** | **1,089,153,993.23** | **57,046,616.39** |

ආදායම් හා වියදම් විශ්ලේෂණය - 2015



**පසුගිය වසර 5 තුළ නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව සහ ලැබූ අදායම**


**නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව (වගුව 1)**

| | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|
| ඖෂධ | 1652 | 1823 | 2104 | 2500 | 2732 |
| වාහන | 1607 | 1606 | 1288 | 958 | 739 |
| රසායන ද්‍රව්‍ය | 3623 | 3767 | 4301 | 4339 | 3844 |
| විදුලි සංදේශ උපකරණ හ වෙනත් | 3807 | 3468 | 3406 | 3523 | 4338 |
| විවිධ ආනයන හා අපනයන | 675 | 934 | 1427 | 2148 | 3274 |


**බලපත්‍ර ආදායම - රුපියල් (වගුව 2)**

| | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|
| ඖෂධ | 83,513,399 | 98,973,707 | 83,036,455 | 124,551,191 | 165,323,691 |
| වාහන | 117,007,354 | 141,991,581 | 125,202,590 | 159,721,793 | 311,027,758 |
| රසායන ද්‍රව්‍ය | 171,284,655 | 220,405,559 | 190,727,940 | 298,927,118 | 248,677,073 |
| විදුලි සංදේශ උපකරණ හ වෙනත් | 49,327,806 | 39,543,218 | 46,973,837 | 57,901,028 | 262,610,141 |
| විවිධ ආනයන හා අපනයන | 11,349,653 | 11,757,369 | 12,059,178 | 28,414,399 | 94,895,008 |
| ප්‍රතිපත්ති | | | | | 6,620,319 |

පසුගිය වසර පහ තුළ එක් එක් ඒකක මගින් නිකුත් කල බලපත්‍ර සංඛ්‍යාව



පසුගියවසර 5 තුළඉපැයූ බලපත්‍ර ආදායම




**පසුගියවසර 5 තුළ ආදායම සහ බලපත්‍ර පිළිබඳ දත්ත සමාලෝචනය**

අංක 3 වගුවට අනුව, පසුගිය වසර 5 තුළ නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව වැඩි වී ඇති අතර 2013 වසරේ එම ආදායමෙහිද සැලකිය යුතු වැඩිවීමක් පෙන්වයි.

2014 හා 2015 වසරවලදී පාවිච්චි කරන ලද වාහන ආනයනය සඳහා නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව පහළ ගියද, බලපත්‍රවලින් ලද ආදායම සීඝ්‍රලෙස වර්ධනය වී ඇත. පාවිච්චි කරන ලද වාහන ආනයනය සඳහා අය කරනු ලබන බලපත්‍ර ගාස්තු ඉහළ නැංවීම මෙන්ම වර්තමාන රජය විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණයන්ද මෙයට හේතු වී ඇත.

2014 වර්ෂය රසායනික ද්‍රව්‍ය ආනයනය සඳහා වැඩිම බලපත්‍ර සංඛ්‍යාවක් නිකුත් කරන ලද හා එමගින් වැඩිම ආදායමක් උපයන ලද වර්ෂය ලෙස වාර්තාගත වුවද, 2015 එම බලපත්‍ර සංඛ්‍යාව මෙන්ම ආදායමද පහළ ගොස් ඇත. රසායනික ද්‍රව්‍ය අතරින් ඛණිජ තෙල් නිෂ්පාදන ප්‍රමුඛත්වයක් ගන්නා අතර එය රටේ නිෂ්පාදන ක්‍රියාවලියේදී සුලභව යොදා ගනී. 2015 වර්ෂයේදී රටේ ආර්ථිකයේ නිෂ්පාදන අංශය සුළු ප්‍රසාරණයක් පමණක් පෙන්වා ඇති එය රසායනික ද්‍රව්‍ය ආනයනය කෙරෙහි බලපෑම් කර ඇත.

විදුලි සංදේශ උපාංගයන් පිළිබඳ සැලකීමේදී නිකුත් කරන ලද බලපත්‍රසංඛ්‍යාව මෙන්ම ඉන් උපයන ලද ආදායමෙහිද සීඝ්‍ර වර්ධනයක් පෙන්වා ඇත. සන්නිවේදන උපාංග ආනයනයේදී ජංගම දුරකථන ආනයනයට ප්‍රමුඛත්වයක් ලැබී ඇත. 2014 හා 2015 වර්ෂවල සන්නිවේදන ක්ෂේත්‍රයේ

වාර්තාගත වර්ධනයක් පෙන්වා ඇති අතර එම වසර 2 තුළ මහා පරිමාණ ව්‍යාපෘති රැසක්ද ක්‍රියාත්මක වී ඇත. සන්නිවේදන උපකරණ හා ජංගම දුරකථන වැනි වෙනත් ආනයනයන් 2015 වර්ෂය තුළ වැඩි වී ඇති අතර, ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි වී ඇති ආයතන සඳහා එම උපාංග ආනයනයට බලපත්‍ර නිකුත් කිරීමේ අරමුණින් ඒකක 05 ආරම්භ කරන ලදි.

අංක 1917/24 දරන 2015.06.03 දිනැති ගැසට් පත්‍රය අනුව ප්‍රතිපත්ති අංශය විසින් ප්‍රතිපත්තිමය අනුමැතියන් ලබා දීම සඳහා ගාස්තු අය කිරීම ආරම්භ කර ඇත. පසුගිය මාස 07ක කාලය තුළ ප්‍රතිපත්ති අංශය අනුමැතියන් සඳහා අය කරන ලද ආදායම රුපියල් මිලියන 6.6ක් ලෙස වාර්තා වී ඇත.


## රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම - 29601

2015 වර්ෂයට අදාළව මෙම දෙපාර්තමේන්තුවේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම අනුමත සීමා යටතේ පවත්වා ගෙන ඇත.(වගුව අංක 09)

ශීර්ෂ අංකය : 296

අමාත්‍යාංශය : ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

| විස්තරය | 2014 සත්‍ය වියදම | 2015 අනුමත ඇස්තමේන්තුව | 2015 සංශෝධිත ඇස්තමේන්තුව | 2015 සත්‍ය වියදම |
|---|---|---|---|---|
| ආරම්භක ශේෂය | 12,783,664.00 | | | 14,383,047.50 |
| එකතු කළා :- | | | | |
| වර්ෂයේ මුළු හර | 3,354,428.00 | 4,000,000.00 | 4,415,000.00 | 2,117,046.80 |
| එකතු කළා :- | | | | |
| මාරු කිරීම් | 2,195,304.50 | | | 1,649,203.00 |
| එකතුව | 18,333,396.50 | | | 18,149,297.30 |
| අඩු කළා :- | | | | |
| වර්ෂයේ මුළු බැර | 2,367,557.00 | 2,000,000.00 | 2,200,000.00 | 3,121,696.00 |
| අඩු කළා :- | | | | |
| මාරු කිරීම් | 1,582,792.00 | | | 2,803,235.00 |
| අවසාන හර ශේෂය | 14,383,047.50 | | | 12,224,366.30 |




Controller General - 01
Import and Export Controller - 01
AC : Assistant Controller - 07

Accountant - 01
AO : Administrative Officer - 01
ITO : Information Technology Officer - 01
IA/DO Investigation Assistant or Development Officer - 06

H Clerk : Head Clerk (MA) - 07
MA : Management Assistant - 46
CMA : Chief Management Assistant - 02
RA : Research Assistant - 01

ITA : Information Technology Assistant - 01
DMA : Data Management Assistant - 01
PA : Policy & Planning Assistant - 01
BA : Budget Assistant - 01
OES : Office Employee Service - 15
Drivers - 04